# බෞද්ධ විනය නීති සහ දඬුවම් ක්‍රම තුළ පවත්නා මනෝවිද්‍යාත්මක පදනම පිළිබඳ විමර්ශනයක්

පූජ්‍ය කිරම විමලතිස්ස හිමි[1]

පූජ්‍ය කරඳගොල්ලේ විජිතතිස්ස හිමි[2]

## හැඳින්වීම

ඉතිහාසය දෙස බලන විට වරදක් කළ පුද්ගලයෙකුට දඬුවම් පැමිණවීමේ දී එකී අපරාධය සිදු කළ තැනැත්තාගේ මානසික ස්වභාවය සැලකිල්ලට ගැනීම ආරම්භ කර තිබෙන්නේ ක්‍රිස්තු වර්ෂාරම්භයෙනුත් බොහෝ කලක් ඉකුත්වගිය පසුවය. (ක්‍රි.ව. 978 පමණ) මීට පෙර බොහෝ විට දඬුවම තීරණය කරන ලදුයේ කරන ලද වරදෙහි බරපතලක ම අනුවය. කල්යත්ම නීතියට අනුව දඬුවම් ලබාදීමේ දී චේතනාවේ වැදගත්කම සලකා බැලීම කෙරෙහි අවධානය යොමු විය. ඒ අනුව සිහි විකල් වූවන්ට හා තමා නීතියට පටහැනි දෙයක් සිදුකරන බව නොදැන වැරදි සිදු කරන තැනැත්තන්ට නීතියෙන් සහනයක් ලැබුණි. මෙම නීතිය පැහැදිලිව ව්‍යවහාර නීතියට පිවිසෙන්නේ 1978න් පසුවය. එහෙත් විනය නීතියක් කඩ කළ පුද්ගලයෙකුට දඬුවම් පැමිණවීමට පෙර එම පුද්ගලයා එකී වරද සිදු කළේ සචේතනිකව ද අචේතනිකව දැයි විමසා දඬුවම් නියම කිරීමක් ක්‍රි.පූ. 6 වැනි සියවසේ පහළ වූ බුදුදහම තුළ දැකිය හැක. එපමණක් ද නොව ''අජානන්ත, ආසාදියන්ත, උම්මත්තක, ඛිත්තචිත්ත, වේදනාදිට්ට, ආදිකම්මික'' ආදී වශයෙන් වරද සිදු කළ පුද්ගලයාගේ කායික හා මානසික ස්වභාවයන්වලට අනුව දඬුවමෙහි ස්වභාවය තීරණය වන විශේෂතා රැසක් ද විනයෙහි අන්තර්ගත වීමෙන් බෞද්ධ විනය නීති තුළ පවත්නා පරිපූර්ණත්වය මොනවට පැහැදිලි වේ. මෙම පර්යේෂණයේ අරමුණ බෞද්ධ විනය නීති හා දඬුවම් තුළ පවත්නා මෙකී සුවිශේෂී මනෝවිද්‍යාත්මක පදනම අධ්‍යයනය කිරීමයි.

## ක්‍රමවේදය හා යොදාගනු ලබන මූලාශ්‍ර

මේ සඳහා භාවිත කරනු ලබන්නේ සාහිත්‍ය මූලාශ්‍ර පමණි. ප්‍රධාන වශයෙන් විනය පිටකය හා එහි අටුවාව ද අවශ්‍යතාවන් අනුව ත්‍රිපිටකයේ සෙසු කොටස් හා බෞද්ධ උගතුන්ගේ අදහස් ද මනෝ විද්‍යාත්මක කරුණු ද උපයෝගී කරගනිමින් බෞද්ධ විනය නීති හා දඬුවම් ක්‍රම සියුම් ලෙස විමර්ශනයට ලක් කිරීමට අපේක්ෂා කෙරේ.

---

1 ආධුනික කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, wimalatissa@gmail.com

2 ආධුනික කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, vijithatissa@yahoo.com

**පර්යේෂණයේ ප්‍රතිඵලය**

මෙම පර්යේෂණයෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ බෞද්ධ විනය නීති හා දඬුවම් ක්‍රම තුළ පවත්නා මනෝවිද්‍යාත්මක පදනම ගැඹුරින් අධ්‍යයනය කිරීමයි.

**සාකච්ඡාව**

බුදුදහම පුද්ගලයාගේ ස්වච්ඡන්දතාව ඉතා උසස් කොට සලකන අතර එයට පටහැනි ලෙස කිසිදු විටෙක කටයුතු කර නොමැත. දඬුවම් ක්‍රම අනුගමනය කර තිබෙන්නේ ද එකී රාමුව තුළය. දඬුවම් පූර්ණ වශයෙන් ප්‍රතික්ෂේපවීමක් බුදුදහමේ දැකගත නොහැකිය. එහෙත් අත්තනෝමතිකව කරන දඬුවම් තුළින් අනිටු ප්‍රතිවිපාක අත්වන බවද දීඝනිකායේ කූටදන්ත සූත්‍රය වැනි සූත්‍රවලින් ප්‍රකට වේ. පුද්ගලයා යම් විසමාකාර ක්‍රියාවක යෙදී සිටීනම් ඔහු එය කරනු ලබන්නේ නොදැනීම නිසා විය හැකිය. එම වරද කළ පමණින් ඔහු පිළිබඳ අවතක්සේරුවට පැමිණ කටයුතු කිරීම බුදුදහම පිළිගන්නේ නැත. ඔහුගේ දැනුමේ පවත්නා යම් අඩුපාඩු නිසා එබඳු ක්‍රියාවල යෙදුණත් නුවනැත්තන්ගේ අවවාද අනුශාසනා මත එම පුද්ගලයා එයින් මුදවා ගත හැකිය. බුදුදහමේ පවත්නා මෙම ක්‍රමයේ සාර්ථක භාවය නිසා මුලදී පමාවූව ද පසුව ගුණධර්ම වඩා විශිෂ්ට ගණයේ ශ්‍රාවකයන් වූ අයුරු අංගුලිමාල වැනි තෙරුවරුන්ගේ කථාතුළින් පැහැදිලි වේ. ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩනය නියම කිරීම සිදුවූයේ ඔහුට අවවාද අනුශාසනා කොට එය පිළිනොගත් නිසා වෙන කළයුත්තක් නොමැති විටය. ධම්මපදට්ඨකථාවේ එන කථාවකින් බුදුරදුන් පුද්ගල මානසිකත්වය තේරුම් ගන්නේ කෙසේදැයි වටහාගත හැකිය.

''එක්තරා භික්ෂූන් වහන්සේ නමක් සිය ශිෂ්‍ය සාමණේරයන් වහන්සේ විශාකාවගේ නිවසේ නතර කොට වෙනත් කටයුත්තක් පිණිස වැඩියහ. මේ අවස්ථාවේ විශාකාවගේ මිනිබිරියක් පැන් බඳුනක් ගෙන එන්නීය. ඒ තුළ දිස්වන සිය මුහුණ දැක සිනාසුනාය. සාමණේරයන් වහන්සේ ද මෙය දැක සිනාසුන අතර එයින් කෝපයට පත් දැරිය ''තට්ටයා සිනාසෙනවා'' යැයි කීවාය. එවිට සාමණේරයන් වහන්සේ නුඹත් තට්ටයා නුඹේ අම්මත්, තාත්තත් තට්ටයෝ යැයි කීහ. මෙහිදි විශාකාවත්, සාමණේරයන්ගේ ගුරුවරයාත්, සාමණේරයන් වහන්සේ වැරදි බව තීරණය කළ නමුත් බුදුරජාණන් වහන්සේ හිස හූ ගෑ පමණින් තට්ටයා යැයි නොකිය යුතු බව වදාළහ. මෙයින් සන්තෝෂයට පත් උන්වහන්සේ සෝවාන් භාවයට පත් විය.

සිග්මන් ෆ්‍රොයිඩ්, රූසෝ වැනි මනෝ විද්‍යාඥයන් ''දඬුවම'' පිළිබඳව පවතින මනෝවිද්‍යාත්මක න්‍යායන් ඉදිරිපත් කර තිබේ. ඔවුන් බොහෝ දෙනෙකුගේ නිගමනය වන්නේ සමාජයේ පුද්ගලයන් විවිධාකාරය එක් එක් පුද්ගලයන්ගේ මානසික මට්ටම්, බුද්ධි මට්ටම් හා වයස් සීමා විවිධාකාරය එම නිසා

දඬුවම් කිරීමට පෙර මානසික පසුබිම හා වරද කිරීමට පෙළඹුණ ආකාරය පිළිබඳ සොයා බැලීම වැදගත් වේ යන්නයි.

භික්ෂූන්ට පනවා ඇති විනය නීතිවල එක් ලක්ෂණයක් වන්නේ නොදැන කළ වැරදි සඳහා දඬුවමකින් තොරව නිදහස් කිරීමය. ඒ අනුව යම් වරදක් වරදක් බව නොදැන කළ කල්හි ආදිකම්මිකයා නිදහස් වෙයි. එහෙත් එය නැවත නොකරන ලෙස විනය නීතියක් පැනවූ පසු කළ හොත් එය වරදක් ලෙස බුදුදහම සළකන අතර එයට සුදුසු දඬුවම් ද ලබා දේ. එහෙත් වරදක් කළ පුද්ගලයා සදහටම පාපකාරී පුද්ගලයෙකු ලෙස සිතා බැහැර කරන්නේ නැත. සෑම පුද්ගලයෙකු තුළම සංවර්ධනාත්මක අවස්ථා තිබිය හැකිය. වරදකරුවෙකු ලෙස සමාජයෙන් අවමානයට පත් අංගුලිමාල එකී විෂමාචාර ආකල්පවලින් මුදවා හික්මවූ පසු ඔහු තුළ පැවති දක්ෂතා මතු වී උදාර මිනිසෙකු බවට පත් විය. තවද පාරජිකා හැරුණු විට භික්ෂුව සඳහා බෞද්ධ විනයේ පනවා ඇති දඬුවම් කිසිවක් දිවි ඇති තුරු බලපවත්වන්නේ නැත. වරදකරුවා වරද පිළිගෙන ආයති සංවරයේ පිහිටීමෙන් නැවත නිවැරදි තත්වයට පත් විය හැකිය. අවබෝධය වරදකරුවාගේ මනසට පිවිසවීමෙන් වරදකරුවා නිවරදි කිරීම බෞද්ධ දඬුවමේ පදනම ය.

විනය පිටකයෙහි උපසපන් භික්ෂූන් විසින් සිදුකරන වැරදි හඳුන්වා තිබෙන්නේ ආපත්ති යනුවෙනි. ආපත්ති යනු වරදට පැමිණීමයි. ශාසනයේ සඳහන් වන බරපතල ම වරද ලෙස සැලකෙන්නේ පාරාජිකා ආපත්තියයි. මෛථුනය සේවනය, සොරකම, මනුෂ්‍ය ඝාතනය හා උත්තරිමනුස්ස ධම්ම යනුවෙන් එය සිව් වැදෑරුම් වේ. මෙය ඡේද්‍යගාමී වශයෙන් හඳුන්වනේ අධිශීල සංඛ්‍යාත උපසම්පදාව සම්පූර්ණයෙන් නැතිවන නැවත පාරිශුද්ධියට පත් විය නොහැකි බැවිනි. සාමණේර කෙනෙක් හෝ ගිහි බවට පත්විය හැකිය.

උට්ඨානගාමී ආපත්තිය තුළින් භික්ෂුත්වය සපුරා අහිමි නොවන අතර විනයෙහි නිර්දේශිත පරිවාස, මානත් හා අබ්භාන යන ප්‍රතිපත්ති සම්පූර්ණ කිරීම තුළින් නැවත ප්‍රකෘති භාවයට පැමිණිය හැකිය. මෙම ප්‍රතිපත්ති පූරණය තුළ වරද සිදුකළ පුද්ගලයාගේ සිත තුළට කළ වරදෙහි ස්වරූපය අවබෝධ වීමට සලස්වා ඉන් නිදහස් වීමට දක්වා ඇති මනෝවිද්‍යාත්මක ක්‍රමවේදය ඉතා විශිෂ්ටය. දහතුනක් වන සංඝාදිසේස මෙම ඇවත් ගණයට අයත් වේ.

දේශනාගාමී ඇවතකට පත් වූ භික්ෂුවක් එම ඇවත තවත් උපසපන් භික්ෂුවකට පවසා නැවත එවැනි වරදක් සිදු නොකරන සේ ලබාදුන් අවවාද පිළිගැනීමෙන් පසු ඇවතින් මිදීම සිදු වේ. ථුල්ලච්චය, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට හා දුබ්භාසිත යන ඇවැත් එසේ දේශනා පාරිශුද්ධියෙන් පිරිසිදු විය හැකි ආපත්ති වශයෙන් සැළකේ.

විනය නීති තුළ පවත්නා තවත් සුවිශේෂත්වයක් වන්නේ ඇවතක් සිදුවූයේ ද නැද්ද යන්න තීරණය කරනු ලබන්නේ ඒ සඳහා මුල් වූ චේතනාව මෙන්ම ඊහා සම්බන්ධ විනයෙහි දක්වා තිබෙන කරුණු ගණනාවක් සම්පූර්ණ වීම පදනම් කරගෙනය.



BHIKSHU UNIVERSITY OF SRI
07 APR 2015

ක්‍රියාව හුදෙක් වැරදි වූ පමණින් දඬුවම් කිරීමක් විනය ප්‍රඥප්තීන් තුළ නැත. පඨම පාරාජිකාපත්තිය තුළින් මේ කරුණ පැහැදිලි කර ගත හැකිය. එහි සඳහන් වන්නේ **"සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මේථුනං ධම්මං පතිසෙවෙය්‍ය..."** මෙහිදී උපසපන් භික්ෂුවක් ස්වකීය ශීලය හෝ එය ආරක්ෂා කරගැනීමට තමන් තුළ වූ දුබල භාවය ප්‍රකාශ නොකර මෛථුනදම් සේවනයෙහි යෙදුනේ නම් පමණි ඔහු එම ඇවතට පත්වන්නේ. තවද සාමණේර නමක් විසි වයස් සැපිරීමෙන් අනතුරුව උපසම්පදා ශීලය ඉල්ලා සිටින්නේ එය රැකීමට තමන්ට හැකියාවක් ඇති බැවිණි.

තවද බෞද්ධ දඬුවම ක්‍රියාත්මක වන්නේ සපුරා සදාචාරාත්මක පදනමක් මත පිහිටාය. දඬුවම මගින් යම්කිසි හික්මීමක් බුදුරදුන් අපේක්ෂා කළත් එයට වඩා අගය කර තිබෙන්නේ ආයති සංවරයේ පිහිටීමයි. කළ වරද මෙහිදී පිළිගන්නා නිසා දඬුවම් දීම ද විඳීම ද පහසු වේ. අඩමසකට වරක් උපෝෂතය කොට තමා පත් වූ ඇවැත තවකෙකුට කියා නිදහස් වීම වැදගත්ය. වරදට අනුව සුදුසු දඬුවමක් පැනවෙන නමුත් එය සිදු කරන්නේ පුද්ගලබද්ධ අධිකාරියක් මගින් නොව සංඝයා විසින් ය. සියල්ලන්ගේ ම එකඟත්වයෙන් යුතු නීති පද්ධතියක් අනුව දඬුවම ක්‍රියාත්මක විය යුතු බව බුදුසමයේ අදහසයි.

**නිගමනය**

දඬුවම මගින් පුද්ගලයාට හිංසාවක් පීඩාවක් පැමිණෙන බව බුදුසමය පිළිගනී. කෲර දඬුවම් නැත්තේ එබැවිනි. දඬුවමින් පුද්ගලයාගේ බාහිර හා අභ්‍යන්තර චර්යා රටාවන් වෙනස් කිරීම බුදුසමයේ අරමුණයි. භික්ෂූන් වහන්සේලාට තම වරද ආරෝපණය කරන්නට අවස්ථාව සලසා දෙන්නේ එහෙයිනි. සිදු වූ වරද දැක ඊට අදාළ ප්‍රතිකර්ම කොට නැවත සකස් කිරීම බෞද්ධ දඬුවමේ ස්වරූපයයි. තමා කළ වරද තමා පිළි ගත යුතුය. දඬුවම් කළ හැක්කේ ද පුද්ගලයා විසින් කරන ලද සචේතනික වැරදිවලට පමණි. චේතනා සහිතව යම් වරදක් කළා නම් ඔහුට දඬුවම් දීම සදාචාර විරෝධී ය. සිහි විකල් වූ උමතු වූවන්ට දඬුවම් දෙන්නට බෞද්ධ අවකාශය තුළ ඉඩක් නොමැත.

තවද බෞද්ධ දඬුවමේ ඇති විශේෂත්වයක් නම් ඇවැතක් සිදු වී ආයතිසංවරයේ පිහිටා නැවත ප්‍රකෘති තත්වයට පත් වූ පසු නැවත ඔහුට පෙර තිබූ සියලු වරප්‍රසාද හිමිවීමයි. ඔහු පව්ටෙකු ලෙස බැහැර කරන්නේ නැත. තවද විනය කර්ම කිසිවක රළු ප්‍රතිපත්ති නොමැත. දඬුවම සිදු කරන අවස්ථාවේ වුවද ඒ පුද්ගලයා කෙරෙහි කිසිදු ද්වේශ සහගත හැඟීමක් ඇති වීමට ඉඩක් නොමැත. විනය නීතිවලට අනුව ක්‍රියාත්මක වීම පමණි සිදුවන්නේ.

මෙසේ බෞද්ධ විනයේ දේශිත දඬුවම් ක්‍රම පිළිබඳව විමසීමේදී පැහැදිලි වන්නේ බෞද්ධ දඬුවම් ක්‍රමවල අරමුණ වැරදි මාර්ගයේ ගමන් කරන පුද්ගලයාට එය අවබෝධ කරදී නැවත නිවැරදි මාවතට පත්කොට විමුක්තිය කරා මෙහෙයවීමයි. එහිදී පුද්ගලයාගේ අවංකභාවය අතිශයින් අගය කොට ඇති අතර

ඒ අවංකභාවය නිසාම ඒ පුද්ගලයාට නිවැරදි තැනැත්තෙක් බවට පත් වී ප්‍රීතියෙන් කල් ගතකළ හැකිය. එබැවින් ආගමික සංස්ථාවක නීති පද්ධතියක් වුව ද දඬුවමක සැබෑ පරමාර්ථය සහ දඬුවමක් තුළින් පුද්ගලයෙකු හික්මවන්නේ කෙසේද ඒ ඔස්සේ අවශ්‍ය අරමුණ කරා පුද්ගලයා මෙහෙය වන්නේ කෙසේ ද යන්න තේරුම් ගැනීමට කදිම උදාහරණයකි බෞද්ධ විනය පිටකය.

**ප්‍රමුඛ පදඃ** දඬුවම්, චේතනාව, බෞද්ධ විනය නීති, මනෝවිද්‍යාත්මක පදනම

**ආශ්‍රිත ග්‍රන්ථ**

මජ්ඣිම නිකාය, II., බු.ජ.ත්‍රි.
පාරාජිකා පාළි, බු.ජ.ත්‍රි.
*ධම්මපදට්ඨකථා* -බුද්ධදත්ත සංස්කරණය
*සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා*, (1929). හේවාවිතාරණ සංස්කරණ, කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය.
රාහුල හිමි, කොටපිටියේ. (සංස්.) (2006) *බෞද්ධ විනය අධ්‍යයනය.* කෝට්ටේ කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව.